**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2017**

**-------------------------------------------------------**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සහ 2015 අංක 01 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලියේ 24 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12 (5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම්

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම්ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

------------------------------------------------------

(i) ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති රු.5,274,039,486 ක් වූ සාමාජික ණය තුළ අන්තර්ගත ඉදිරි වර්ෂය ඇතුළත අයවීමට නියමිතව ඇති ණය ප්‍රමාණය හඳුනා ගෙන ප්‍රමිතියේ 76 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල රු.1,739,700,000 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර විකිණීමෙන් උපයා තිබූ ලාභයට අදාලව ගලපන ලද වට්ටම් හා අධිමිල වෙන් වශයෙන් අනාවරණය කිරීමකින් තොරව ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව වට්ටම් හා අධිමිල වෙන් වශයෙන් අනාවරණය කිරීමකින් තොරව බැඳුම්කර විකිණීමෙන් ලද රු.8,848,340 ක්වූ ලාභය පමණක් අවසාන ගිණුම්වල දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

------------------------------------------------

ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති සාමාජිකයින්ට ලබා දී ඇති අර්ථසාධක ණය වෙනුවෙන් අයවිය යුතුව ඇති දිගුකාලීන ණය ශේෂයේ වැඩිවීම වූ රු.528,709,114 ක අගය ප්‍රමිතියේ 25 (ඉ) ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද ලැබිය යුතු ණය වාරිකවල අඩුවීම වූ රු.18,879,390 ක ප්‍රමාණය අඩුකළ විට ලැබෙන ශුද්ධ අගය වූ රු.509,829,724 ක අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ඇතුළත් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක සේවා සැපයීම වෙනුවෙන් එළඹ තිබූ සේවා ගිවිසුම්වලට අදාළව 2018 ජනවාරි සිට ජූනි 30 දක්වා ඉදිරි කාල පරිච්ඡේදය වෙනුවෙන් ගෙවා තිබුණු රු.171,810 ක් වූ සේවා ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර බැඳුම්කර දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පොළී ආදායම රු.4,573,370 ක් විය යුතු වුවද එය ගිණුම්වල රු.4,649,171 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ බැඳුම්කර ආදායම හා ලැබිය යුතු ආදායම රු.75,801 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉදිරි වර්ෂයේදී කල්පිරීමට නියමිත රු.මිලියන 5150 ක් වූ ස්ථාවර තැන්පතු අගය කෙටිකාලීන ආයෝජන ලෙස සලකා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ඇතුළත් කළ යුතු වුවද එම අගය දිගුකාලීන ආයෝජන යටතේ ජංගම නොවන වත්කම් ලෙස ඇතුළත් කර තිබුණි. ඒ අනුව මේ සම්බන්ධව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍ය ගැලපීම් සිදුකර නොමැති බව ද නිරීක්ෂණය විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------

1982 පෙබරවාරි 02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 155(5) වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනවල සේවය කර සේවය අවසන් වූ සේවා දායකයන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂය නිදහස් කිරීමට අදාළ විස්තර, නිලධාරියා සේවයෙන් ඉවත්ව මාස 02 ක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කළ යුතු අතර එය උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රමාදය මත යොමු කිරීමේ ප්‍රමාදයක් සිදු වුවහොත් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය ප්‍රකාරව දායකයින්ට පොළිය ගෙවීමට සිදු වුවහොත් එම පොළිය එයට වගකිව යුතු නිලධාරියාට අධිභාර කළ යුතුව ඇත. එසේ වුවද ප්‍රමාද කාලය මාස 04 සිට මාස 20 දක්වා විහිදී තිබූ නමුත් එම ප්‍රමාද කාලය වෙනුවෙන් ගෙවූ පොළිය චක්‍රලේඛ ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 ගෙවිය යුතු ගිණුම්**

--------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම්වල ආපසු ගෙවිය යුතු යටතේ අවලංගු කළ චෙක්පත් ලෙස දක්වා තිබූ රු.36,216,547 ක ශේෂය තුළ විවිධ හේතූන් මත ගෙවීම් අත්හිටුවා තිබූ අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් වලට අදාල වටිනාකම රු.35,544,619 ක් වූ චෙක්පත් 459 ක් විය. අර්ථසාධක ප්‍රතිලාභීන්ගෙන් එම චෙක්පත් වලින් රජයට අයවිය යුතු මුදල් අයකර ගෙන ඉතිරි මුදල් අදාළ ප්‍රතිලාභීන් වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,041,807,362 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,792,617,408 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.249,189,954 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ආදායම් රු.306,753,732 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය විය. රජයට ගෙවන ලද ආදායම් බදු ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.2,454,475,779 ක් වූ දායකත්වය 2017 වර්ෂය අවසාන වන විට රු.3,155,181,485 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**කළමණාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

මුදල් පොත පවත්වාගෙන යාමේදී සෑම මසකම අවසානයේ හර ශේෂයක් නොව බැර ශේෂයක් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් මුදල් සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය දුර්වල බව නිරීක්ෂණය විය.

**5.** **පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) මුදල් පොත යාවත්කාලීනව පවත්වාගෙන යාම | මුදල් පොත දෛනිකව යාවත්කාලීන කර නොතිබීම. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | හිමිකම් නොපෑ ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |